යුආස 07 වෙනුවට

---

| ප්‍ර | දින කාලඝණය | ආරක්‍ෂක විග්‍රහය | ආරම්භකයාගේ අංකය | විශේෂ උපදෙස් |
|---|---|---|---|---|
| ප්‍ර | 070945 (2024/09) | නිවර්ග | ආසේමු(බටහිර)/ප්‍ර/සම්/ඉන්ධන/04/2024 ( ) | ෆැක්ස්/ඊමේල් |

---

ගෙන් : ආසේමු (බටහිර)
වෙතට : 61 පාබල සේමු

---

**ආරක්‍ෂක ඉන්ධන වැය වාර්ථා ඉදිරිපත් කිරිම සබැදිව උපදෙස් ලබාදිම** (.) ආරක්‍ෂක රාජකාරි සදහා මෙම ආසේමු යටතේ පාලනය වන සියළුම ස්ථාන වෙත ආරක්‍ෂක ඉන්ධන නිකුත් කරනු ලබන අතර, එම ඉන්ධන වැය වාර්ථා ඔබ පාබල සේමු වෙතින් නිර්දේශ කර ඉහළ මුලස්ථානයන් වෙත ඉදිරිපත් කිරිම සදහා මෙම ආසේමු වෙත ඉදිරිපත් කරනු ලබයි (.) ඔබ පාබල සේමු වෙතින් ආරක්‍ෂක ඉන්ධන වැය වාර්ථා යුද්ධ හමුදා තැපැල මගින් ඉදිරිපත් කරනු ලබන අතර, එසේ ඉදිරිපත් කිරිමේදි විවිධ ගැටළුකාරි තත්වයකට මුහුණ දි ඇති බැවින් නැවත දැනුම් දෙන තුරු ආරක්‍ෂක ඉන්ධන වැය වාර්ථා විෂයභාර ලිපිකරු විසින් රැගෙන විත් මෙම ආසේමු වෙත භාරදිම්/භාරගැනිම් සිදුකරන ලෙස මින් දන්වා සිටිනු ලැබේ (.) නිකස //

---

**කේ එම් පි එස් කොඩිතුවක්කු ආර්එස්පි**
කර්නල්
පිටත්කර හරින නිලධාරි

යුආස 07 වෙනුවට

---

| ප්‍ර | දින කාලඝණය | ආරක්‍ෂක විග්‍රහය | ආරම්භකයාගේ අංකය | විශේෂ උපදෙස් |
|---|---|---|---|---|
| ප්‍ර | 070946 (2024/09) | නිවර්ග | ආසේමු(බටහිර)/ප්‍ර/සම්/ඉන්ධන/04/2024 ( ) | ෆැක්ස්/ඊමේල් |

---

ගෙන් : ආසේමු (බටහිර)
වෙතට : 61 පාබල සේමු

---

**ගෙන්වා ගැනිම - ආරක්‍ෂක ඉන්ධන විෂයභාර ලිපිකරු** (.) යොමුව (.) එක (.) ආසේමු(බටහිර)/ප්‍ර/සම්/ඉන්ධන/04/2024 (149 ) හා 2024.09.05 දිනැති මෙම ආසේමු ලිපිය (.) දෙක (.) 611 පාබල බසේමු/ප්‍ර/ක්‍රියා/22/01/2024 (96) හා 2024.09.06 දිනැති ඔබට පිටපත් සහිතව මෙම ආසේමු අමතා ඇති 611 පාබල බසේමු ලිපිය (.) මෙම ආසේමු වෙතින් නිකුත් කර ඇති ආරක්‍ෂක ඉන්ධන සදහා වැය වාර්ථා කඩිනමින් ඉදිරිපත් කරන ලෙස යොමුව එක දරණ මෙම ආසේමු ලිපිය මගින් දැනුම් දි ඇත (.) එහෙත් යොමුව දෙක දරණ 611 පාබල බසේමු ලිපිය මගින් පාබල බසේමු වෙත නිකුත් කර ඇති ආරක්‍ෂක ඉන්ධන සදහා වැය වාර්ථා ඉදිරිපත් කර ඇති බැව් දැනුම් දි ඇත (.) එහෙත් ඔබ පාබල සේමු වෙතින් ඉදිරිපත් කර ඇති වැය වාර්ථා කොපමණද යන්න නිවැරදිව සටහන්ව නොමැති බැවින් එම විස්තර සකස් කරගැනිම සදහා ආරක්‍ෂක ඉන්ධන විෂයභාර ලිපිකරු පහත සදහන් කර ඇති විස්තර සමගින් 2024.09.09 දින 0830 පැයට මෙම ආසේමු වෙත අනිවාර්‍යයෙන්ම රපෝර්තු කරවන ලෙස මින් දන්වා සිටිනු ලැබේ (.) **එක** (.) **ඔබ පාබල සේමු වෙතින් මේ වන තෙක් ඉදිරිපත් කර ඇති වැය වාර්ථා ලිපිගොණුව සහ ඉදිරිපත් කරන ලද වැය වාර්ථාවන්හි නිවැරදි සාරාංශ වාර්ථාවක් (ඔබ යටතේ පාලනය වනු ලබන ස්ථානයේ වෙත මෙම ආසේමු වෙතින් ලබා දි ඇති ඉන්ධන සහ ඔබ පාබල සේමු වෙතින් නිකුත් කර ඇති ඉන්ධන සදහා වෙන් වෙන් වශයෙන්)** (.) දෙක (.) **මෙම ආසේමු වෙතින් ඔබ පාබල සේමු වෙත ආරක්‍ෂක ඉන්ධන ලැබිම් සහ නිකුත් කිරිම් සටහන් කරන ලද තොග පොත (.) තුන (.) ඔබ යටතේ පාලනය වනු ස්ථානයන් වෙත ලබා දි ඇති ආරක්‍ෂක ඉන්ධන කොපමණද යන්න සාරාංශ වාර්ථාවක්** (.) නිකස //

---

**කේ එම් පි එස් කොඩිතුවක්කු ආර්එස්පි**
කර්නල්
පිටත්කර හරින නිලධාරි